නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය
வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு
Ministry of Housing & Samurdhi

4 මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 ஆம் மாடி, செத்சிரிபாய, பத்தரமுல்ல.
4 floor, Sethsiripaya, Battaramulla.

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

මගේ අංකය / எனது இல / My No: DDD/HO/04/Circular
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2015.06.08

**දිවිනැගුම චක්‍රලේඛ අංක:- 2015/07**

**සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්**

**සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් වෙත,**

## දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන - 2015

### 01. හැදින්වීම.

**"ජීවනෝපාය සංවර්ධන වැඩසටහන"**, අඩු ආදායම්ලාභී පවුල්වල නිෂ්පාදන ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව වර්ධනය කිරීම මඟින් ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරීම, රැකියා අවස්ථාවන් පුළුල් කිරීම තුළින් දිළිඳුකම ඉතා අවම මට්ටමකට පත්කිරීම පරමාර්ථ කරගෙන ක්‍රියාත්මක වේ. එමඟින් දේශීය නිෂ්පාදිතයට අඩු ආදායම් ලබන ප්‍රජාවගේ දායකත්වය ඉහළ නැංවීමට අපේක්ෂිතය. ප්‍රජාව හා ප්‍රජා මූල සංවිධාන, දිවි නැගුම ප්‍රජා මූල බැංකු සහ දිවිනැගුම නිලධාරීන් මෙන්ම අදාල තාක්ෂණික සහාය සේවා සපයන අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ඒකාබද්ධතාවයෙන් යුතුව ව්‍යාපෘති හඳුනාගෙන සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙහිදී දැනටමත් පවත්වාගෙන යනු ලබන කුඩා පරිමාණ ව්‍යවසායයන් ප්‍රවර්ධනයටත්, ශක්‍යතාවය පරීක්ෂා කර නව ව්‍යවසායකයින් බිහි කිරීමටත්, රැකියා වෙළඳපොළෙහි ඉල්ලුමට සරිලන පුහුණු ශ්‍රමිකයින් සැපයීම සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමටත් ව්‍යාපෘති සැලසුම් කිරීමට නියමිතය.

ඒ අනුව පහත සඳහන් ප්‍රධාන අංශ යටතේ වඩාත් ඉහළ සංවර්ධන විභවතාවයකින් යුතු ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්වේ.

1. කෘෂි කාර්මික සංවර්ධනය.
2. පශු සම්පත් සංවර්ධනය.
3. ධීවර කටයුතු සංවර්ධනය.
4. සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධනය.
5. රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන.

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி / Additio[illegible] | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / [illegible]r (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|
| දුරකථන/ தொலைபேசி/Telephone: | 011-2872202 | 011-286[illegible] | [illegible]73799 | 011-2889046 |
| ෆැක්ස්/ தொலைமடல்/Fax: | 011-2889002 | | [illegible]73996 | |
| ඊ-මේල්/ மின்னஞ்சல்/ E-Mail: | dgdivineguma@gmail.com | anuradhakum@yahoo.com | hrddivineguma@gmail.com | |

mailto:anuradhakum@yahoo.com
Ctrl+Click to follow link

## 02. ඒ ඒ අංශ යටතේ හඳුනාගෙන ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති

හඳුනාගත හැකි ව්‍යාපෘති සඳහා වන උදාහරණ කිහිපයක් පහත දක්වා ඇති අතර අදාල වන වෙනත් ව්‍යාපෘති ද හඳුනාගත හැකි වේ.

### 2.1 කෘෂි කාර්මික සංවර්ධනය

- පැල තවාන් වැඩි දියුණු කිරීම.
- මී මැසි පාලනය.
- බිම්මල් වගාව.
- දේශීය ආහාර බෝග වගාව ප්‍රවර්ධනය කිරීම.
- විසිතුරු මල් හා පැල වගාව.
- අගය එකතු කළ නව නිෂ්පාදන ඇතිකිරිම.(එළවළු පළතුරු විජලනය,fresh cut ජෑම්, කෝඩියල්)
- ගෙවතු වගා ප්‍රවර්ධනය.
- දේශීය ඖෂධ වගාව ව්‍යාප්ත කිරිම.
- සුළු පරිමාණ වැවිලි භෝග වගා කරුවන් දිරිමත් කිරීම.
- කාබනික නිෂ්පාදන හා කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම.
- පසු අස්වනු තාක්ෂණය උපයෝගි කරගත් ව්‍යාපෘති.

### 2.2 පශු සම්පත් සංවර්ධනය

- දේශීය කිරි පරිභෝජනය ප්‍රචලිත කිරිම.
- කිරි ආශ්‍රිත අගය එකතු කල නිෂ්පාදන වැඩි දියුණු කිරීම. (යෝගට්, මුදවපු කිරි ආදි)
- සත්ත්ව අභිජනන මධ්‍යස්ථාන පිහිටුවීම.
- කිකිලි පැටව් නිෂ්පාදනය. (කුඩා පරිමාණ බිත්තර රක්කනාගාර ඇතිකිරීම)
- ගවගාල්/ කුකුළු කූඩු වැනි ව්‍යාපෘති.

### 2.3 ධීවර කටයුතු සංවර්ධනය

- ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම.
- කාලීන ජලාශවල මසුන් ඇති කිරීම.
- පොකුණු තුළ මත්ස්‍ය වගාව වැඩි දියුණු කිරීම.
- විසිතුරු මත්ස්‍ය වගාවන් ප්‍රචලිත කිරීම.
- කරවල/උම්බලකඩ/ජාඩි වැනි අගය එකතු කල නිෂ්පාදන කෙරෙහි ප්‍රතිලාභීන් උනන්දු කිරිම.

### 2.4 සුළු පරිමාණ ව්‍යවසාය සංවර්ධනය

- හස්ත කර්මාන්ත ගම්මාන වැඩි දියුණු කිරීම.
- වඩු කර්මාන්තය ප්‍රවර්ධනය කිරිම.
- ලුහු ඉංජිනේරු වැඩපලවල් ඇති කිරීම.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත සංවර්ධනය කිරිම.
- ජංගම දුරකථන අලුත් වැඩියා කිරීම.
- සුළු පරිමාණ ගරාජ් ඇති කිරීම.
- ඇඳුම් මැසීමේ මධ්‍යස්ථාන ඇති කිරීම.
- කුඩා පරිමාණ ඇඹරුම් මධ්‍යස්ථාන ඇති කිරීම.

- පොල්/කිතුල්/තල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
- ප්‍රධාන කර්මාන්ත වලට අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදනය කිරිම.

## 2.5 රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන

- අඩු ආදායම්ලාභී පවුල්වල තරුණ තරුණියන්ට රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණුව ලබාදීම සහ ඔවුන් දේශීය හා විදේශීය රැකියා වෙළඳපල වෙත සෘජුවම යොමු කිරීම.
- රැකියා අපේක්ෂාවෙන් සිටින තරුණ තරුණියන්ගේ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සහිතව ජීවදත්ත ලබාගෙන මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්/ ප්‍රාදේශීය නිලධාරීන්ගේ සහාය ලබාගනිමින් ප්‍රතිලාභීන්ට අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශණ ලබාදීම හා එම දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇති රැකියා වෙළඳපල පිළිබඳ තොරතුරු ලබාදීම. ඒ අනුව සුදුසු රැකියාවක නිරතකිරීමට අවශ්‍ය මඟපෙන්වීම්, උපදේශණය හා වෘත්තීය පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතුවේ.
- මේ සඳහා පහත සඳහන් වෘත්තීය පුහුණු ආයතනවල සහාය ලබාදීමට එම ආයතන එකඟතාවය පලකර ඇත.මෙම ආයතන වලට අමතරව වෙනත් පිළිගත් වෘත්තීය පුහුණු ආයතනද තෝරාගත හැකිය.

| අනු අංක | ආයතනය | දූරකථන අංක |
|---|---|---|
| 01 | වෘත්තීය පුහුණු අධිකාරිය, 354/2, 4 වන මහල, නිපුනතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05 | 011-2596516<br>011-2581904 |
| 02 | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, වැලිකඩ, රාජගිරිය | 011-2876386<br>071-4553641 |
| 03 | මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව. 9 වන මහල, සෙත්සිරිපාය 2 අදියර, බත්තරමුල්ල. | 011-2187131<br>011-2186022<br>011-2187133 |
| 04 | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරන ආයතනය, 78, ගාලු පාර, කොළඹ 03 | 011-2382201<br>011-2382212 |

| අනු අංක | ආයතනය | දුරකථන අංක |
| --- | --- | --- |
| 05 | කුඩා හා මධ්‍යම පරිමාන ව්‍යවසායකයින්ගේ වාණිජ මණ්ඩලය, ව්‍යවසායකත්ව සංවර්ධන දෙපාර්තමේන්තුව, කළමණාකරණ පීඨය ,ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,ගංගොඩවිල, නුගේගොඩ. | ඉසුරු රාජපක්ෂ මහතා, සභාපති 0759361233 |
| 06 | කුඩා ව්‍යාපාර සංවර්ධන කාර්යාංශය, තරුණ කටයුතු අමාත්‍යාංශය,420, බෞද්ධාලෝක මාවත,කොළඹ-07. | සුධීර ජයවර්ධන මහතා,අධ්‍යක්ෂ 0714899609 |
| 07 | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය, ,780, මරදාන පාර, කොළඹ 10. | ලක්ෂ්මන් විජේවර්ධන මහතා, අධ්‍යක්ෂ 0715806574 011-2672186 |
| 08 | කාර්මික සංවර්ධන මණ්ඩලය, 615,ගාලු පාර, කටුබැද්ද, මොරටුව. | සභාපති 0718063290 |
| 09 | ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, අංක 582, ගාලුපාර, ගල්කිස්ස. | 011-2605625 011-2623490 011-2638686 |
| 10 | ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, කාර්මික ජනපදය, ඒකල, පන්නල. | 011-2236284 011-2236307 |
| 11 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, අංක 557, ඕල්කට් මාවත, කොළඹ 10 | අධ්‍යක්ෂ ජනරාල් 011-3137290 011-2431288 |
| 12 | ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය , සව්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ-07 | 011-2686092 011-2686236 |

## 03. ව්‍යාපෘති හඳුනා ගැනීම

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ හඳුනාගනු ලබන ව්‍යාපෘති දිවිනැගුම ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් සඳහා සෘජු ප්‍රතිලාභ සැලසෙන ව්‍යාපෘති විය යුතුය. ප්‍රදේශයට සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීමේදී එම ව්‍යාපෘති වල තිරසාරභාවය තහවුරු කිරීම සඳහා මූලිකව පහත කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ.

- ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභී කැමැත්ත.
- ප්‍රතිලාභී/ ප්‍රජා දායකත්වය.
- පවත්නා ගැටළු හා අවශ්‍යතා.
- ප්‍රතිලාභීන්ගේ ආදායම් තත්ත්වය ඉහල නැංවිය හැකි බව.
- ව්‍යාපෘති ආරම්භ කිරීමට පවතින පාරිසරික විභවතාවය.
- නිෂ්පාදන අලෙවියට පවතින පහසුකම් හා විභවතාවය.
- රැකියා අවස්ථා ජනනය වීම.

- පරිසර හිතකාමී ව්‍යාපෘති වීම.
- අගය එකතු කළ නිෂ්පාදන බිහිකිරීම.
- ඵලදායිතාවය ඉහළනැංවීම.

ප්‍රදේශයේ පවතින විවිධ ප්‍රජා සංවිධාන/ ප්‍රජා කණ්ඩායම් මගින් ක්‍රියාත්මක කළ හැකි නව ව්‍යාපෘති හඳුනාගැනීමද වැදගත් වේ. එම ව්‍යාපෘති අඩු ආදායම්ලාභීන්ට පමණක් ඍජු ප්‍රතිලාභ සැලසෙන පරිදි විය යුතුය. එමෙන්ම හස්ත කර්මාන්ත ගම්මාන හෝ එවැනි සමජාතීය නිෂ්පාදනයන් බහුලව සිදුකෙරෙන ව්‍යවසායකත්ව ගම්මාන සඳහා විශේෂ අවධානයක් යොමුකිරීමටද අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති හඳුනා ගැනීමේ දී ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලට අදාල සියළු පාර්ශවයන් එකතුවී සාකච්ඡා කර නිවැරදි ඵලදායී ව්‍යාපෘති පමණක් හඳුනා ගත යුතුය.

ඒ ඒ ව්‍යවසායක ගම්මාන පදනම් කරගත් සමිති සමාගම් පිහිටුවීමටත්, අදාල ආයතන වල ලියාපදිංචි කිරීමටත් එම සංවිධාන හරහා ව්‍යාපෘති හඳුනා ගැනීමටත් කටයුතු කළ යුතුය. ව්‍යාපෘති සඳහා එම ප්‍රජා සංවිධාන වල නිර්දේශය ලබා ගැනීම අත්‍යාවශ්‍යය.

**මෙහිදී පසුගිය වසර පහක කාලය තුලදී ජීවනෝපාය සහන නොලැබූ පවුල් සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළයුතු අතර පසුගිය වසර 02 තුලදී ණය හැර අනෙකුත් ජීවනෝපාය සහන ලද පවුල් සඳහා නැවත මෙම වසරේ ප්‍රතිලාභ ලබා දීම සිදු නොකළ යුතු අතර එසේ කරන්නේ නම් එය වඩාත් විනිවිදභාවයකින් හා සාධාරණීයකරණයක් සහිතව දිස්ත්‍රික් දිවි නැගුම අතිරේක** අධ්‍යක්ෂ **ජනරාල්ගේ (දිස්ත්‍රික් ලේකම්ගේ) පෞද්ගලික අනුමැතිය මත ලබාදිය හැකිය.**

## 04. ව්‍යාපෘති සැලසුම් කිරීම.

විනිවිද භාවයෙන් යුතුව සියළු පාර්ශවයන් ඒකාබද්ධව හඳුනාගනු ලැබිය යුතු මෙම ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කළ යුතුවේ. ඒ සඳහා වන සරල ආකෘතියක් ඇමුණුම 01 මගින් දක්වා ඇත.මෙම වාර්තාව සකස් කිරීම ව්‍යාපෘති කළමණාකරුගේ හා අදාල දිවිනැගුම සංවර්ධන නිලධාරීගේ වගකීමකි. ව්‍යාපෘතියට විස්තරාත්මක ඇස්තමේන්තුවක් ඇතුලත් වියයුතු අතර එම ඇස්තමේන්තුව අදාල තාක්ෂණික සහාය ලබා ගන්නා ආයතන වල නිර්දේශ සහිතව සකස් කරගත යුතුය. සකස් කළ ව්‍යාපෘති වාර්තාව නැවත අදාල පාර්ශවයන් සමඟ සමාලෝචනයට ලක් කළ යුතුය. ඒ අනුව ව්‍යාපෘති පිරිවැය මූල්‍යනය කරන ආකාරය පිළිබඳවද තීරණයන්ට එළඹිය හැකිය.

## 05. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය.

මෙම වැඩසටහන දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ , දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂකගේ හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ දිවිනැගුම නිලධාරින් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුවේ. ඒ අනුව වසමකට හෝ වසම් කිහිපයකට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම අදාල මූලස්ථාන කළමණාකරු/ ව්‍යාපෘති කළමණාකරු හා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් විසින් ඉටුකළ යුතුය.

5.1 වසම් මට්ටමින් යෝජිත සෑම ව්‍යාපෘති යෝජනාවක් සඳහා ම අදාල ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාමීය ප්‍රජා සංවිධාන නියෝජිතයින්ගේ නිර්දේශය ලබාගත යුතුවේ.

5.2 තවද අදාල තාක්ෂණික නිලධාරීන්ගේ හා රේඛීය ආයතන වල නිර්දේශයන්ද ලබා ගත යුතුය.

5.3 මෙම ව්‍යාපෘති යෝජනා දිවිනැගුම සංවර්ධන නිලධාරි/ ව්‍යාපෘති කළමණාකරුගේ නිර්දේශය සහිතව මූලස්ථාන කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

5.4 මූලස්ථාන කළමණාකරු විසින් තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව අදාල ව්‍යාපෘති යෝජනා සඳහා තම නිර්දේශ සමඟින් ප්‍රදේශීය සම්බන්ධීකරණ කමිටුව පිහිටුවා තිබේ නම් එහි අනුමැතිය/ එකඟත්වය ලබාගෙන ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය. මුළු ඇස්තමේන්තු මුදලින් 90% ක උපරිමයක් දක්වා ප්‍රදානයක් වශයෙන් ලබාදෙන ව්‍යාපෘති සහ සාමූහික ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය, දිස්ත්‍රික් ලේකම්ගේ පෞද්ගලික අවධානයට යොමු කර අනුමැතිය ලබා ගත යුතු අතර ප්‍රතිලාභියාගේ/ප්‍රතිලාභීන්ගේ දායකත්වය අවම වශයෙන් 10%ක් විය යුතුය. මෙහිදී ශ්‍රමය, අමුද්‍රව්‍ය හෝ වෙනත් දායකත්වයක් මේ සඳහා ලබාදිය හැක.

5.5 සාමූහික ව්‍යාපෘති වලදී එම වත්කම් නඩත්තු කිරීම ප්‍රතිලාභ බෙදාදීම පිළිබඳ වගකීම අදාල ලියාපදිංචි සමිති සමාගම් වෙත පැවරෙන පරිදි ව්‍යාපෘති වාර්තාව සකස් කරගත යුතුය.

5.6 ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ප්‍රතිපාදන ලබාගැනීම සඳහා දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වෙත යොමුකල යුතුවේ.

5.7 දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ විසින් තම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කල යුතු ජීවනෝපාය ව්‍යාපෘති යෝජනාවන් කෙරෙහි සමස්ථ අධීක්ෂණය සිදුකල යුතු අතර මාසිකව ප්‍රගතිය සමාලෝචනය කරමින් වඩාත් ඵලදායිව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

5.8 දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වරුන් විසින් තම ප්‍රතිපාදන සීමාවන්ට යටත්ව අනුමත සියලු ව්‍යාපෘති යෝජනා, අග්‍රිම ලබාගැනීම සඳහා ඇමුණුම 02 හි දැක්වෙන ආකෘතිය මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

5.9 ව්‍යාපෘති ආරම්භ කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම, ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම හා වාරික ගෙවීම් නිසි පරිදි සිදුකරන බවට ප්‍රතිලාභීන් සමග ගිවිසුම් ගත විය යුතුය.මෙහිදී ප්‍රාදේශීය ලේකම් හෝ ඒවෙනුවට බලය පවරන ලද දිවිනැගුම මූලස්ථාන කළමණාකරු, ප්‍රතිලාභීන් සමග ගිවිසුමකට එළඹීම අත්‍යාවශ්‍ය වේ. (ගිවිසුමෙහි කෙටුම්පතක් ඇමුණුම් අංක 03 හි දැක්වේ.)

5.10 ප්‍රතිලාභී දායකත්වය සඳහා දිවිනැගුම ප්‍රජා මූල බැංකු මගින් ණය ලබාදීම සම්බන්ධීකරණය කළයුතු අතර ඒ සඳහා එම බැංකු වල විධි විධානයන්ට අනුව කටයුතු කළ යුතුය.

5.11 ඒ ඒ අංශයට අදාල අත්‍යාවශ්‍ය විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් අවශ්‍ය වුවහොත් විධිමත් සැලැස්මක් ඉදිරිපත් කර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ.

5.12 අනුමත කරනු ලබන ජීවනෝපාය ව්‍යාපෘති සඳහා වූ සියළු මිලදී ගැනීම් රජයේ ප්‍රසම්පාදන නීති රීති, මුදල් රෙගුලාසි අනුගමනය කරමින් අදාල ආයතන, දෙපාර්තමේන්තු වල මිලගණන්ද සැලකිල්ලට ගෙන ගෙවීම් සිදුකිරීම අත්‍යවශ්‍ය වන අතර අදාල රේඛිය ආයතන වල නිර්දේශයන්ද ලබා ගත යුතු වේ.

5.13 සියළුම ව්‍යාපෘති සඳහා සිදුකළයුතු ගෙවීම් 2015.12.15 දිනට පෙර අවසන් කිරීමට හැකිවනසේ ව්‍යාපෘති ආරම්භ කිරීමට වග බලා ගතයුතු වේ.

**රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ඉහත ඡේද 2.5 යටතේ දක්වා ඇති ආයතන වලින් මෙන්ම අනෙකුත් පිළිගත් වෘත්තීය පුහුණු ආයතන වලින් පුහුණු පාඨමාලා හැදෑරීමට යොමුවන ප්‍රතිලාභීන් සඳහා පහත සඳහන් පරිදි කටයුතු කළයුතු වේ.

5.14 ප්‍රතිලාභියා සහ අවශ්‍ය වෘත්තීය පුහුණු පාඨමාලාව හඳුනාගත් පසුව අදාල පුහුණු ආයතනයෙන් වියදම් ඇස්තමේන්තුවක් ලබාගත යුතුවේ. එයට පාඨමාලා ගාස්තු, ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ ගාස්තු , ගමන් වියදම් ආදී වියදම් ඇතුළත් කළ හැකිය.

5.15 ප්‍රතිලාභියාගේ පවුලේ ආර්ථික හැකියාව , දිවිනැගුම ප්‍රජා මූල බැංකුවෙන් ලබාගත හැකි ණය මුදල, වෙනත් මූලාශ්‍ර හරහා ලබාගත හැකි සහන, පිළිබඳව සලකා බලා මෙම වැඩසටහන යටතේ ලබාදිය හැකි මූල්‍ය දායකත්වය තීරණය කළ යුතුය. රජයේ දායකත්වය මුළු ඇස්තමේන්තු මුදලෙන් 40% ඉක්මවා නොයා යුතු අතර රජයේ දායකත්වය එක් ව්‍යාපෘතියක් / එක් පුද්ගලයෙකු සඳහා රු 40,000 ට වැඩි නොවිය යුතුය. අවශ්‍ය අවස්ථාවලදී සහන කාලයක්ද සහිතව දිවිනැගුම ප්‍රජාමූල බැංකු ණයක් ලබාදීම මඟින් ප්‍රතිලාභියා රැකියා ගැන්වෙන තෙක් පාඨමාලාවේ රැඳී සිටීමට වැඩි පෙළඹවීමක් ලබාගත හැකිවනු ඇත. මෙලෙස ලබාදෙන 60% ක ප්‍රතිලාභී දායකත්වයෙන් අවමය 20% ක් සෘජු ප්‍රතිලාභී දායකත්වය වීමත් උපරිමය 40% ක් බැංකු ණය මුදලක් වීමත් වඩා උචිතය.

5.16 අදාල මූල්‍ය කටයුතුවලදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු හරහා අදාළ ආයතන සමඟ ගණුදෙණු කිරීමට උපරිම වශයෙන් සලකා බැලිය යුතුවේ. පාඨමාලා ගාස්තු සෘජුවම අදාල ආයතනයට ගෙවීමටත් අනෙකුත් වියදම් පාඨමාලාවේ කාලය සලකා බලා මාසික / කාර්තු වාරික වශයෙන් ගෙවීමට කටයුතු කළයුතු වේ. ප්‍රතිලාභියා සහ පවුලේ අය සමඟ ගිවිසුම් ගත වීමද අත්‍යාවශ්‍ය වේ. මෙහිදී ප්‍රතිලාභියා සහ ඔහුගේ භාර කරුවන් එක් පාර්ශවයකටත් ප්‍රාදේශීය ලේකම් හෝ ඒ වෙනුවට බලය පවරන ලද දිවිනැගුම මූලස්ථාන කළමණාකරු අනෙක් පාර්ශවයටත් වන පරිදි ගිවිසුම් ගත විය යුතුය.

## 06. ව්‍යාපෘති අධීක්ෂණය,මෙහෙයුම් හා ඇගයුම් කටයුතු

6.1 ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම් කිරීමේ ක්‍රම වේදයක් ඔබ විසින් සකස් කර ගැනීමට කටයුතු කළයුතු අතර ප්‍රාදේශීය මට්ටමටද අවශ්‍ය උපදෙස් ලබාදීම වැදගත් වේ. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචනයන් සිදු කළයුතු අතර ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී විම අත්‍යාවශ්‍ය වේ.

6.2 මෙහිදී ප්‍රජා මූල සංවිධානද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් සකස් කරවා ගත යුතු වේ.

6.3 ඒ අනුව දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාසික ප්‍රගතිය මේ සමඟ අමුණා ඇති ඇමුණුම් අංක 04 හි දැක්වෙන ආකෘතියට අනුව සකස් කර එළඹෙන මස 05 වෙනි දිනට පෙර මා වෙත ලබා දිය යුතුය. මේ සඳහා divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කළ හැකිය.

6.4 පසුගිය වර්ෂවල ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය ව්‍යාපෘතිද අඛණ්ඩව පසු විපරම් කිරීම නිලධාරීන්ගේ වගකීමකි. එම ව්‍යාපෘති අසාර්ථක වී ඇත්නම් ඒ සඳහා සුදුසු පිළියම් යෙදීමට අවශ්‍ය පියවර ගත යුතුය. මෙහිදී අදාල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම ද අත්‍යාවශ්‍ය වේ.

6.5 රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහනට අනුව ප්‍රතිලාභියා රැකියා ගැන්වෙන තෙක් හා ලබාගත් ණය මුදල් ගෙවා අවසන් වන තෙක් ප්‍රජාමූල සංවිධානය හා දිවිනැගුම සංවර්ධන නිලධාරීන් මගින් අඛණ්ඩව පසු විපරම සිදුකළ යුතුවේ.

6.6 වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ අදාළ ප්‍රාදේශීය/ ග්‍රාමීය නිලධාරීන් හා දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන ලවා සෘජු පසු විපරමක් අඛණ්ඩව සිදු කිරීම මගින් විරැකියාවෙන් පෙලෙන යොවුන් ප්‍රජාව රැකියා ගැන්වීමේ වැඩ සටහන සාර්ථක කර ගත යුතුවේ.

6.7 ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳව අංශ අනුව, නිර්ණායක අනුව ආදි වශයෙන් විස්තරාත්මක විශ්ලේෂණයන් සිදුකර සුවිශේෂ නිරීක්ෂණයන් මා වෙත වාර්තා කළයුතු වේ . ඕනෑම විටෙක අවශ්‍ය පරිදි ලබා ගැනිම පිණිස ව්‍යාපෘති දත්ත, ඡායාරූප හා තොරතුරු සකස් කර තබා ගත යුතුය.

6.8 මේ යටතේ භාණ්ඩාගාර අරමුදල් යොදා ගෙන ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මෙන්ම ජීවනෝපාය චක්‍රීය අරමුදල් යොදාගෙන ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඊ දිවිනැගුම ව්‍යාපෘතියේ (e-divineguma project) ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කළමණාකරණ මොඩියුලයට (Project and Program Management Module) අතුලත් කිරීමටත් ප්‍රගතිය නිසි පරිදි නියමිත දින වලම යාවත් කාලීන කිරීමටත් කටයුතු කළයුතු වේ. මෙම මොඩියුලය මගින් ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචනය සිදුකරනු ඇත. දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචනයටද එය යොදා ගැනීම අත්‍යාවශ්‍යය.

## 07. ප්‍රතිපාදන

**මුදල් මූලාශ්‍රයන්:-**

I. භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන

II. සෘජු ප්‍රතිලාභි දායකත්වය

( මෙය ප්‍රජාමූල බැංකු ණය, ප්‍රතිලාභියාගේ මූලධනය, ප්‍රජා සංවිධාන අරමුදල් වලින් සමන්විත විය හැකිය.)

**ප්‍රතිපාදන නිදහස් කිරිම.**

මේ යටතේ ඔබවෙත ලබාදෙන ප්‍රතිපාදන ග්‍රාම නිලධාරි වසම් අතර සමානව බෙදා හැරීම අපේක්ෂා නොකෙරේ. ඉතා ඉහළ විභවතාවයක් පවතින ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට හැකි වන පරිදි , එමෙන්ම ආදායම් විෂමතාවය හා දරිද්‍රතාවය අවම කිරීමට වැඩි බලපෑමක් ඇති වන පරිදි මෙම ප්‍රතිපාදන කළමණාකරණය කර ගත යුතුය.

රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු වැඩසටහන හැර අනෙකුත් ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සීමාවන් පහත සඳහන් නිර්ණායක වලට අනුකූලව තීරණය කළයුතු වේ.

| අනු අංකය | ප්‍රතිපාදන සීමාව | නිර්ණායක |
|---|---|---|
| 01 | ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලෙන් උපරිම වශයෙන් 90% ක් ප්‍රදානයක් ලෙස ලබා දීම. (අවම වශයෙන් 10% ක් ප්‍රතිලාභියා විසින් දායක කළ යුතුය.) | • ආර්ථික දායකත්වයක් ලබාදිය නොහැකි ලෙස දිගුකාලින රෝග වලින් පෙලෙන්නන් සිටින (වකුගඩු, පිළිකා වැනි රෝගවලින් පෙලෙන, ඔත්පලවූ වයස්ගත මව් පියන් සිටින) අඩු ආදායම් ලාභී පවුල්<br>• දිගුකාලීන ආබාධිත තත්ත්වයන්ගෙන් පෙලෙන සාමාජිකයින් සිටින අඩු ආදායම් ලාභී පවුල්<br>• ආර්ථික වශයෙන් බලවත් පීඩාවන්ට ලක්වූ වැන්දඹු/ කාන්තා මූලික අඩු ආදායම් ලාභී පවුල් |
| 02 | ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලින් උපරිම වශයෙන් 40% ක් ප්‍රදානයක් වශයෙන් ලබා දිය හැකි අතර සෘජු ප්‍රතිලාභී දායකත්වය අවම වශයෙන් 10% ක් විය යුතුය. ඉතිරි මුදල ජීවනෝපාය චක්‍රීය අරමුදලට අයකරගැනීමට යටත්ව ණය මුදලක් ලෙස ලබාදීම. | • ආර්ථික හා සමාජයීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති අඩු ආදායම්ලාභී පවුල් (වසමේ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් විසින් අඩු ආදායම්ලාභීයෙකු බවට සහතික කළ යුතුය.) |
| 03 | සමාන වාරික වලින් මුළු මුදලම නැවත අයකර චක්‍රීය අරමුදලට දායක කරගත හැකි පරිදි ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලින් 50% ක ප්‍රතිපාදන ලබා දීම. ඉතිරි 50% ක මුදල අදාළ ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය. | • ගෙවීම් හැකියාව ඇති යම් සතුටුදායක ආදායම් මට්ටමකට පැමිණි අඩු ආදායම් ලබන ප්‍රතිලාභීන් සඳහා<br>• දිවිනැගුම වැඩසටහන සඳහා ඒකාබද්ධ වීමට කැමැත්තක් දක්වන අඩු ආදායම් ලබන ප්‍රතිලාභීන් සඳහා |
| 04 | දිවිනැගුම ප්‍රජා මූල බැංකු / වෙනත් බැංකු ණය පහසුකම් ලබාදීමට අවශ්‍ය මඟපෙන්වීම සිදුකිරීම. | • වඩා වැඩි ආර්ථික වර්ධනයක් අපේක්ෂිත ප්‍රතිලාභීන් සඳහා |

ප්‍රතිලාභියා සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේදී,

- මුළු ඇස්තමේන්තු මුදලෙන් උපරිම වශයෙන් 90% ක් ප්‍රදානයක් වශයෙන් ලබාදෙන විටදී එහි උපරිම සීමාව රු. 50,000/ ක් විය යුතුවේ. (මෙම ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය)
- ජීවනෝපාය චක්‍රීය අරමුදලට 50% ක් අයකර ගැනීමේ ක්‍රමයට ව්‍යාපෘතියක උපරිම ඇස්තමේන්තු මුදල් සීමාව රු. 75,000/ ක් විය යුතුවේ. එම සීමාව ඉක්මවා ගියද රු. 75,000/- ක් සේ සළකා කටයුතු කළ යුතුය. සීමාව ඉක්මවා ගිය මුදල ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය.
- සාමූහික ව්‍යාපෘති සඳහා රජයේ දායකත්වයේ උපරිම සීමාව රු 50,000/- කි. එකවර 50% බැගින් දායක කිරීම හෝ ඇස්තමේන්තු මුදලින් 50% ක් ප්‍රදානයක් වශයෙන් හා 50% ක් චක්‍රීය අරමුදලට බැර කරන ණයක් වශයෙන් ලබා දිම කළ හැකිය.
- බැංකු ණය ලබා දීම සඳහා සම්බන්ධීකරණය කළ යුතු අතර , එම ණය මුදල් පිළිබඳ සීමා ව්‍යාපෘති අනුව ඒ ඒ බැංකු විසින් ලබා දෙනු ඇත.
- ජීවනෝපාය චක්‍රීය අරමුදලට 50% ක් අයකර ගැනීමේ පදනම මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඊට අදාල සහන කාලයක් ලබා දෙන්නේද යන්න ව්‍යාපෘති ලාභියාගේ ආදායම් මට්ටම සහ අදාල ව්‍යාපෘතියේ ස්වභාවය මත තීරණ වලට එළඹිය යුතු අතර, සහන කාලයක් ලබා දෙන්නේ නම් උපරිම සහන කාල සීමාව මාස 03ට සීමා විය යුතුය. වාරික මුදල් අය කර ගැනීමේ උපරිම කාල සීමාව වසර 03 ක් නොඉක්මවිය යුතුය.

**ජීවනෝපාය චක්‍රීය අරමුදල**

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා ලබාදෙන ඍජු ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී මෙම අරමුදල මඟින් ණය පහසුකම් ලබාදීමට කටයුතු කළ හැකිය. තවද,රජයේ ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සහන සැලසීමට හැකියාව නොලැබෙන එහෙත් අනිවාර්යෙන්ම ව්‍යාපෘති ගැන්විය යුතු ප්‍රතිලාභීන්ට චක්‍රීය අරමුදල මඟින් ණය ලබාදීමට ප්‍රමුඛත්වය දිය යුතුය.

ව්‍යාපෘති සඳහා ලබාදෙන ජීවනෝපාය චක්‍රිය අරමුදල්, ව්‍යාපෘතියේ ස්වභාවය හා අවශ්‍යතාවය අනුව නැවත අය කර ගැනීමට මාස 03 ක උපරිමයකට යටත්ව සහන කාලයක් ලබාදිය හැකිය. වාරික වශයෙන් මුළු මුදලම මෙම අරමුදලේ දැනට ක්‍රියාත්මක පොලී අනුපාතය මත ආපසු අය කර ගත යුතු අතර අය කරනු ලබන උපරිම කාලය මාස 36 කට සීමා විය යුතුය.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ගිවිසුම් ප්‍රකාරව ආපසු අයකරන රජයේ දායක මුදල් නැවත අය කර ගැනීම තුලින් චක්‍රිය අර මුදල ශක්තිමත් කිරීම කල යුතු අතර එම මුදල් නැවත නැවත ව්‍යාපෘති වල යෙදවීම ඔබගේ මූලික වගකීමකි.

## 09. පරිපාලන වියදම්

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ව්‍යාපෘති සඳහා වන රජයේ වියදමෙන් 1% ක් පරිපාලන වියදම් ලෙස දැරීමට හැකියාව ඇත. මෙයින් 0.20% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ද, ඉතිරි 0.80%, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ද බෙදී යන පරිදි පරිපාලන වියදම් දැරීමට හැකිය.

මෙම චක්‍රලේඛය පිළිබඳව වැඩි දුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 011-2869824/ 011-2872253 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ජීවනෝපාය සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

මෙම චක්‍රලේඛ උපදෙස්, මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන නීති රීති අනුගමනය කරමින් මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ ඇතුළු නිලධාරින්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කරමි.

ධම්මික ගුණවර්ධන

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)

පිටපත්:-

1. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කාරු.දැ.ගැ.ස
2. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා -කාරු.දැ.ගැ.ස
3. ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය -කාරු.දැ.ගැ.ස
4. අතිරේක ලේකම් (දිවිනැගුම), නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය -කාරු.දැ.ගැ.ස
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
6. ප්‍රධාන ගණකාධිකාරි දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.ස
8. සියළුම අංශ ප්‍රධානීන් , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව -අ.ක.ස
9. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් -කාරු.දැ.ගැ.ස හා අ.ක.ස
10. සියළුම දිවිනැගුම මූලස්ථාන කළමණාකරුවන් -අ.ක.ස හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම සඳහා